සැ. යු. - 2012.04.27 දින පළ වූ අංක 1,756 දරන ගැසට් පත්‍රයේ I-III සහ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,757 - 2012 මැයි 04 වැනි සිකුරාදා - 2012.05.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 912 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 914 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 916 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 මැයි මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 අප්‍රේල් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## පන්නල ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

වයඹ පළාත් රාජ්‍ය සේවයේ පන්නල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවාගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පන්නල ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා සේවකයින් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

| | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු | 04 | PL-1-2006(iv) රු. 11,730-10x120-10x130 - 10x145 - 12 x 160 - රු. 17,600. | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/(9 වසර) සමත් වී සිටිය යුතුය. |
| 02 | මුරකරු | 01 | PL-1-2006(iv) රු. 11,730-10x120-10x130- 10x145-12 x 160 - රු. 17,600. | අ.පො.ස. (ස.පෙළ) විභාගයෙන් විෂයයන් දෙකක් සමත්වීම (වෛකල්පිත විෂයයන් හැර) |
| 03 | කාර්යාල කාර්ය සහායක | 01 | PL-1-2006(iv) රු. 11,730-10x120-10x130- 10x145- 12 x 160 - රු. 17,600. | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයයන් දෙකක් සමත්වීම (වෛකල්පිත විෂයයන් හැර) |
| 04 | රියදුරු | 01 | PL-III-2006(iv) රු. 12,470-10x130-10x145 - 10x160 - 12 x 170 - රු. 18,860. | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්වී තිබිය යුතු ය. |

02. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය ;
(ii) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය ;
(iii) පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අවම වශයෙන් වසර 03ක කාලයක් තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.(ඡන්ද හිමි නාමලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතු ය.) ;
(iv) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබුවකු නොවිය යුතු යි.;
(vi) රියදුරු තනතුරු සඳහා පිරිමි අයදුම්කරුවන් පමණක් ඉල්ලුම්කළ යුතු ය.

03. *ශිල්පීය සේවක ගණයට බඳවාගැනීම :*

තනතුර :- රියදුරු සේවය 111
අවශ්‍ය ශිල්පීය නිපුනතා/ප්‍රවීනතා
තාරබර හොන්ඩරය 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මඟීන් 32ට වඩා ගෙනයාමට හැකි බස් රථපැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය. (ඒ පන්තියේ රියදුරු බලපත්‍රයක්)

*පලපුරුද්ද :*

වාහන රියදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු ය. (සේවා සහතිකයක් තිබිය යුතු ය.)

*04. බඳවා ගැනීමේ ක්‍රමය :*

සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වන අයදුම්කරුවන්ගෙන් අධ්‍යාපන සුදුසුකම් සහ වාචික පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

*05. අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත 2012.05.31 හෝ එදිනට පෙර "ලේකම්, පන්නල ප්‍රාදේශීය සභාව, පන්නල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ii) අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ අදාල තනතුර සඳහන් කර ".............................. තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කර අයදුම්පත එවිය යුතු ය.

(iii) අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය.

(අ) උප්පැන්න සහතිකය ;
(ආ) අධ්‍යාපන සහතික ;
(ඇ) පාසලෙන් අස්වීමේ සහතිකය ;
(ඈ) පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය) ;
(ඉ) මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් ;
(ඊ) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ දී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල පන්නල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

කේ. එම්. ප්‍රේමරත්න,
ලේකම්,
පන්නල ප්‍රාදේශීය සභාව.

2012 අප්‍රේල් මස 11 වැනි දින,
පන්නල, ප්‍රාදේශීය සභාව,
පන්නල.

***ආදර්ශ අයදුම්පත්‍රය***

*පන්නල ප්‍රාදේශීය සභාව*

***පන්නල ප්‍රාදේශීය සභාවේ ....................................... තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. අයදුම්කරුගේ නම මුලකුරු සමග :——————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.
3. ස්ථිර ලිපිනය :——————————.
4. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :——————————.
5. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————.
6. දිස්ත්‍රික්කය :——————————.
7. උපන් දිනය : අවුරුද්ද :——————————, මාසය :——————————, දිනය :——————————.
8. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :——————————, මාස :——————————, දින :——————————.
9. ස්ත්‍රී /පුරුෂ භාවය :——————————.
10. විවාහක ද/අවිවාහක ද යන වග :——————————.
11. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————.
12. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
13. අධ්‍යාපන සුදුසුකම් :——————————.
අ.පො. ස. (සා.පෙළ) විභාගය සමත් වර්ෂය හා විභාග අංකය :

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

14. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :——————————.
15. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ආදේශක/අනියම් ලෙස සේවය කරන්නේ නම් එම සේවා කාලය සහ විස්තර :

එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම මත ද යන වග)

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

05-25

# පළාත් පාලන නිවේදන

## හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව

2012.01.06 දිනැති අංක 1740 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ iv(අ) වැනි කොටස පළාත් සභා (විවිධ දැන්වීම්) යටතේ හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව මගින් පළවූ 01-186/8 දැන්වීමේ වරිපනම් බදු අය කිරීමේ ප්‍රතිශතයන් :

| | |
|---|---|
| හඟුරන්කෙත බල ප්‍රදේශයේ | 7% (සියයට හතක ප්‍රතිශතය) |
| රිකිල්ලගස්කඩ බල ප්‍රදේශය | 7% (සියයට හතක ප්‍රතිශතය) |
| උඩපදියපැලැල්ල බල ප්‍රදේශය | 6% (සියයට හයක ප්‍රතිශතය) |

යන්න නිවැරදි විය යුතු ය.

සභාපති,
ප්‍රාදේශීය සභාව,
හඟුරන්කෙත.

2012 මාර්තු මස 13 වන දින,
හඟුරන්කෙත ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,
හඟුරන්කෙත.

05-23

---

## තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගලගෙදර හා අරඹේකඩේ උප කාර්යාල සීමා තුළ දියුණු ගම් ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 134(1) වගන්ති ප්‍රකාර තුම්පනේ ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි පහත උපලේඛනයේ දැක්වෙන ගම් ප්‍රදේශ දියුණු ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එල්. එස්. බී. ගිරිහාගම,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2012 මාර්තු මස 12 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

*01. මැදවල පාර :*

හැදෙනිය නගරයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා සීමාවේ සිට එම සීමාවේ දකුණු පසට පී. රණසිංහ මහතාගේ ඉඩම ද, වම් පසට ඩබ්. ජී. අබේසිංහ මහතාගේ කඩය ද, එකී දේපල ද ඇතුළත් වන පරිදි එතැන් සිට කිලෝමීටර් 02ක් මැදවල දෙසට යාමේ දී හමුවන වම් පසට ඊ. ඩබ්. එන්. කේ. බස්නායක මහතාගේ නිවස ද, දකුණු පසට සමරකෝන් මහතාගේ නිවස ද, එකී දේපල දෙක ද ඇතුළත්ව එම පාරේ මධ්‍ය ලක්ෂයේ සිට මීටර් 50 ක් වම් පසට ද මීටර් 50ක් දකුණු පසට ඇතුළත් වන පරිදි මැදවල පාර ලෙස නව වරිපනම් බදු ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම.

*02. බොක්කාවල පාර :*

කුරුණෑගල නුවර පාරේ අරඹේකඩේ හන්දියේ සිට ආරම්භ වී ගිරිහාගම හන්දිය දක්වා බොක්කාවල දෙසට කිලෝමීටර් 02ක දුරක් ඇතුළත් වන පරිදි එම පාරේ මධ්‍ය ලක්ෂයේ සිට මීටර් 50ක් වම් පසට ද, මීටර් 50ක් දකුණු පසට ඇතුළත් වන පරිදි බොක්කාවල පාර ලෙස නව වරිපනම් බදු ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම.

*03. නුවර කුරුණෑගල පාර :*

කුරුණෑගල නුවර පාරේ දකුණට ජයසේන මහතාගේ නිවස වරිපනම් අංක 144, වම් පසට ජී. ද අල්විස් මහතාගේ ඉඩම වරිපනම් අංක 145 දැනට තක්සේරු වී ඇති එම දේපල සීමාවේ සිට නුවර දෙසට කිලෝමීටර් 2.2 ක් ගිය තැන වම්පසින් හමුවන කේ. ඇම්. රත්නායක මහතාගේ නිවස ද,

වරිපනම් අංක 10 හා දකුණු පසින් හේරත් මහතාගේ නිවස වරිපනම් අංක 03 දක්වා එම දේපල මායිමේ සිට එම මාර්ගයේ මධ්‍ය ලක්ෂයේ සිට මීටර් 50ක් වම් පසට ද මීටර් 50ක් දකුණු පසට ඇතුළත් වන පරිදි මෙම නව වරිපනම් බදු ප්‍රදේශ නුවර කුරුණෑගල පාර ලෙස ප්‍රකාශයට පත් කිරීම.

*04. උසාවිය පාර දීර්ඝ කිරීම*

මහනුවර - රඹුක්කන පාරේ ගලගෙදර බස්නැවතුම් පොලින් ආරම්භ වී යන උසාවිය පාරේ වරිපනම් අංක 44 ඩබ්. ඒ. පී. එන්. කේ. එස්. තේනකෝන් මහතාගේ නිවස දකුණු පසටත් වරිපනම් අංක 46 ඩී. කේ. පෙරේරා මහතාගේ නිවස වම් පසටත් මායිම්ව එම දේපල මායිමේ සිට ඉදිරියට මීටර් 60ක් ගියපසු හමුවන සුරංජිත් ගුණසේකර මහතාගේ නිවස වම්පසටත් දකුණු පසට කුසුමාවතී වීරසේකර මියගේ නිවසද එකී දේපල දෙක ද ඇතුළත්ව එම පාරේ මධ්‍ය ලක්ෂය සිට මීටර් 50ක් වම් පසට ද මීටර් 50ක් දකුණුපසට ඇතුළත් වන පරිදි උසාවිය පාර නව වරිපනම් බදු ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කිරීම.

*05. මල්පොලයාය පාර*

මහනුවර - රඹුක්කන පාරේ ගලගෙදර මහජන ක්‍රීඩාංගණය ඉදිරිපිටින් යන මල්පොලයාය පාර වරිපනම් අංක 490/3/ඒ සිත්ති සීනියා මියගේ නිවස වම්පසට මායිම්වත් වරිපනම් අංක 490/4 සමාඩ් හාජියාර් මහතාගේ නිවස දකුණු පසට මායිම්වත් එතැන් සිට ඉදිරියට එම මාර්ගයේ මීටර් 50ක් පමණ ඉදිරියට යාමේ දී හමුවන කුඹුරු යායට අයත් ඇල දක්වා එම පාරේ මධ්‍ය ලක්ෂය සිට මීටර් 50ක් වම්පසටත් මීටර් 50ක් දකුණු පසට ඇතුළත් වන පරිදි මල්පොලයාය පාර ලෙස නව වරිපනම් බදු ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම.

*06. කවුඩැල්ල සිට මැදගොඩ හන්දිය දක්වා (මැදගොඩ කවුඩැල්ල පාර)*

මහනුවර - රඹුක්කන පාරේ කවුඩැල්ල පාලමේ ආරම්භක මායිමේ සිට රඹුක්කන දෙසට කිලෝමීටර් 1 1/2ක් ගිය විට හමුවන මැදගොඩ පිරිවෙනට හැරෙන හන්දිය දක්වා එම මාර්ගයේ මධය ලක්ෂයේ සිට මීටර් 50 වම් පසටත් මීටර් 50ක් දකුණු පසට ඇතුළත් වන පරිදි කවුඩැල්ල මැදගොඩ හන්දිය දක්වා නව වරිනම් බදු ප්‍රදේශ බවට ප්‍රකාශයට පත් කිරීම.

*07. කොහිලඇල්ල පාර*

ගලගෙදර මඩිගේ, රඹුක්කන පාරේ මඩිගේ පල්ලිය අසලින් වැටී ඇති කොහිල ඇල්ල පාරේ ආරම්භක මායිම මඩිගේ පල්ලියේ සුසාන භූමිය වම් පසට හා දකුණු පසට මායිම්ව කොහිලඇල්ල දෙසට යන මාර්ගයේ හසන් රියාස් මහතාගේ නිවස වම් පසින්ද දකුණු පසින් ද එම්. එච්. එම්. සතාර් මහතාගේ නිවසත් දක්වා එම නිවාස දෙක ද ඇතුළත්ව මීටර් 200ක් දුර ඇති එම මාර්ගයේ වම් පසට මීටර් 50ක් හා දකුණු පසට මීටර් 50ක් ඇතුළත පිහිටි ප්‍රදේශය ද එම මාර්ගයේ එම්. එස්. එම්. ෆදීර් මහතාගේ නිවස මායිමෙන් යන කොහිලඇල්ල හරස් මාර්ගය කොහිලඇල්ල ප්‍රධාන මාර්ගයෙන් ආරම්භ වී ඉදිරියට මීටර් 40ක දුරක් ගිය විට හමුවන වම් පසට අබ්දුල් හමීඩ් මහතාගේ (වරිපනම් අංක 52/5) නිවස ද දකුණු පසින් ඒ. එම්. මුසාමිල් මහතාගේ (වරිපනම් අංක 52/3) නිවස ද මායිම්ව එම මාර්ගයේ මධ්‍ය ලක්ෂයේ සිට වම් පසට මීටර් 50ක් හා දකුණු පසට මීටර් 50ක් ඇතුළත කොහිලඇල්ල හරස් මාර්ගය ලෙසත් ප්‍රධාන මාර්ගය කොහිලඇල්ල පාර ලෙසත් නව වරිපනම් බදු ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීම.

*08. නිදහස් පටුමග*

ගලගෙදර මඩිගේ රඹුක්කන පාරේ ජබ්බාර් මුස්ලිම් විද්‍යාලය ඉදිරිපසින් යන නිදහස් පටුමග ආරම්භයේ කේ. එම්. එන්. ඒ. සත්තාර් මහතාගේ වරිපනම් අංක 423/1 නිවස, වම් පසින් ද යූ. ඒ. විමලසිරි සිල්වා මහතාගේ ගරාජය වරිපනම් අංක 435 දකුණු පසින් ද මායිම්ව ඉදිරියට මීටර් 210ක් දුරක් ගිය විට හමුවන ඊ. පී. බී. නිහාල් ආරියවංශ මහතාගේ නිවස වම්පසින් ද අමීර් මහතාගේ ඉඩම දකුණු පසින් ද එම දේපළ දෙක ද ඇතුළත්ව එම මාර්ගයේ මධ්‍ය ලක්ෂයේ සිට වම්පසට මීටර් 50ක් ද දකුණු පසට මීටර් 50ක් ද ඇතුළත ප්‍රදේශය නිදහස් පටුමග නව වරිපනම් බදු ප්‍රදේශ බවට පත් කිරීම.

*09. අක්කරේ පාර*

ගලගෙදර මඩිගේ රඹුක්කන පාරේ ජබාර් මුස්ලිම් විදුහල අසලින් යන අක්කරේ පාරේ ආරම්භයේ වම් පසට කේ. එම්. ඒ. සත්තාර් මහතාගේ ඉඩමට ද දකුණු පසට ජබාර් මුස්ලිම් විද්‍යාලයේ වැට ද එයින් ඉදිරියට මීටර් 75ක් ගිය පසු වම් පසින් ඒ. එල්. සී. කරුණාතිලක මහතාගේ නිවස ද දකුණු පසින් අමින් මහතාගේ නිවස ද එම නිවාස දෙක ද ඇතුලුව එම මාර්ගයේ මධ්‍ය ලක්ෂයේ සිට වම් පසට මීටර් 50ක් ද දකුනු පසට මීටර් 50ක් ද ඇතුළත් වන පරිදි අක්කරේ පාර නව වරිපනම් බදු ප්‍රදේශ බවට පත් කිරීම.
නිවේදනය සනාථ කරමි.

05-43

# විවිධ දැන්වීම්

## නාවලපිටිය නගර සභාව

### 2012 වර්ෂය සඳහා ගාස්තු පැනවීම

නගර සභා ආඥාපනතේ පැවරී ඇති බලතල හා විධිවිධානවලට යටත්ව නාවලපිටිය නගර සභා සීමාව තුළ 2012 වර්ෂය සඳහා පහත දැක්වෙන ගාස්තු ප්‍රමාණයන් අයකිරීමට නාවලපිටිය නගර සභාව විසින් තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. අදාල ගාස්තු 2012 ජනවාරි මස 01 වැනි දින සිට 2012 දෙසැම්බර් මස 31 දින දක්වා පමණක් වලංගු බව ද වැඩිදුරටත් නිවේදනය කරමි.

නිශාන්ත රණසිංහ,
සභාපති,
නාවලපිටිය නගර සභාව.

2011 නොවැම්බර් මස 08 වැනි දින,
නාවලපිටිය,
නගර සභා කාර්යාලයේ දී ය.

නාවලපිටිය නගර සභාව 2012 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි විවිධ ගාස්තු අය කරනු ලැබේ.

| 01. *පෝර්ම/අයදුම්පත්‍ර ගාස්තු :* | | *රු. ශ.* |
|---|---|---|
| (i) | වෙළෙඳ බලපත්‍ර අයදුම්පත් ගාස්තු | 50 00 |
| (ii) | බයිසිකල් බලපත්‍ර | 05.00 |
| (iii) | පරිසර බලපත්‍ර පෝර්ම ගාස්තු | 500 00 |
| (iv) | පරිසර බලපත්‍ර අළුත්කිරීමේ පෝර්ම ගාස්තු | 100 00 |
| (v) | ජල අයදුම්පත්‍ර ගාස්තු | 50 00 |
| (vi) | A.T.D. පෝර්ම ගාස්තු (නම වෙනස් කිරීම) | 500 0 |
| (vii) | අනු බෙදුම් පෝර්ම ගාස්තු | 300 00 |
| (viii) | ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු | |
| | වාණිජ | 1,500 00 |
| | නිවාස | 750 00 |
| (ix) | ටෙන්ඩර් පෝර්ම ගාස්තු | 2,000 00 |
| (x) | පුස්තකාල සාමාජික පෝර්ම ගාස්තු | 25 00 |
| (xi) | පුස්තකාල සාමාජික ගාස්තු (වැඩිහිටි) | 50 00 |
| | පුස්තකාල සාමාජික ගාස්තු (ළමා) | නොමිලේ |
| (xii) | පෙර පාසල් අයදුම්පත්‍ර ගාස්තු | 100 00 |
| (xiii) | සැලසුම් ශිල්පීන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 3,000 00 |
| (xiv) | ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමේ ගාස්තු | 2,000 00 |
| | අනුකුලතා සහතික ගාස්තු | 3,000 00 |
| | විරීරේඛා සහතික ගාස්තු | |
| | වාණිජ | 2,000 00 |
| | නිවාස | 500 00 |

| 02. *ආදාහනාගාර ගාස්තු :* | | |
|---|---|---|
| (i) | නගර සීමාව තුළ පදිංචි | 5,000 00 |
| (ii) | නගර සීමාවෙන් පිටත පදිංචි | 7,500 00 |
| | (ප. ව. 6.00 පසුව ආදාහනය සඳහා අමතර ගාස්තුව) | 1,000 00 |

| 03. *භූමදාන :* | | |
|---|---|---|
| (i) | නගර සීමාව තුළ පදිංචි | 2,000 00 |
| (ii) | නගර සීමාවෙන් පිටත පදිංචි | 3,000 00 |

| 04. *දේහය/භස්මාවශේෂ තැන්පත් කිරීම :* | | |
|---|---|---|
| (i) | නගර සීමාව තුළ පදිංචි (අඩි 1 1/2x 1 1/2) ප්‍රමාණ ඉඩමක් | 10,000 00 |
| (ii) | නගර සීමාවෙන් පිටත පදිංචි (අඩි 1 1/2x 1 1/2) ප්‍රමාණ ඉඩමක් | 15,000 00 |
| (i) | නගර සීමාව තුළ පදිංචි (අඩි 6x 3 ) ප්‍රමාණ ඉඩමක් | 40,000 00 |
| (ii) | නගර සීමාවන් පිටත පදිංචි (අඩි6x3) ප්‍රමාණ ඉඩමක් | 50,000 00 |

| 05. *බැනර් ප්‍රදර්ශනය කිරීම* | | *රු. ශ.* |
|---|---|---|
| (i) | ස්ථිර (වර්ග අඩියකට) | 100 00 |
| (ii) | තාවකාලික (වර්ග අඩියකට) (සති දෙකක් සඳහා පමණි) | 25 00 |

| 06. *ගෝඝාතක ගාස්තු :* | |
|---|---|
| එක් ගවයෙක් සඳහා ගාස්තුව | 100 00 |
| එක් එළුවෙක් සඳහා ගාස්තුව | 50 00 |
| විශේෂ අවස්ථාවක දී (ගව/එළු) | 500 00 |

| 07. *ජල බවුසර් 01ක් ලබාදීමේ ගාස්තු :* | |
|---|---|
| නගර සභා සීමාව තුළ | 1,000 00 |
| නගර සීමාවෙන් පිටත | 2,500 00 |
| නිවාඩු දිනයන්හි මීට අමතරව රියදුරු බටා හා සැතපුම් කුලිය ද ගෙවිය යුතු ය. | |
| විසන්ධි කල ජල නල නැවත සන්ධි කිරීමේ ගාස්තු | 350 00 |

| 08. *විනෝද බදු :* | |
|---|---|
| සිනමා ශාලාවලින් ප්‍රවේශ පත්‍ර වටිනාකමින් | 10% |
| සිනමා නොවන දර්ශන වලින් වටිනාකමින් | 25% |

| 09. *සභාවේ ලියාපදිංචි රථ නැවතුම් පාරවල් සඳහා රථ වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු :* | |
|---|---|
| ලොරි/බස් රථ | 10,000 00 |
| වෑන් /කාර් | 10,000 00 |
| ත්‍රීරෝද රථ | 7,000 00 |

| 09.01 *රථ වාහන ගාස්තු අයකිරීම :* | *ගාස්තු* *මාසිකව* | *පැයකට* |
|---|---|---|
| ලොරි/බස් රථ | 600 00 | 10 00 |
| වෑන්/කාර් | 400 00 | 20 00 |
| ත්‍රීරෝද රථ | 300 00 | 30 00 |

| 10. නගර ශාලාව කුලියට දීම : | | |
|---|---|---|
| (i) | ප්‍රවේශ පත්‍ර සහිතව දිනකට | 3,000 00 |
| | ප්‍රවේශ පත්‍ර රහිතව දිනකට | 1,500 00 |
| | විදුලි ගාස්තුව | 500 00 |
| | තැන්පත් මුදල | 5,000 00 |
| (ii) | වෙළඳ කටයුතු සඳහා | 5,000 00 |
| | විදුලි ගාස්තුව | 500 00 |
| | තැන්පත් මුදල | 5,000 00 |
| (iii) | සම්මන්ත්‍රණ/දේශන/රැස්වීම් සඳහා දිනකට | 1,500 00 |
| | ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ගාස්තු ශාලා ගාස්තුවලට අමතරව | |
| | එක් දර්ශනයක් සඳහා (පැය 3කට වඩා වැඩි) | 350 00 |
| | එම (පැය 3කට වඩා අඩු) | 500 00 |
| | විදුලි ගාස්තුව | 200 00 |
| | නගර ශාලාවේ පුටු කුලියට දීම (එක් පුටුවකට) | 05 00 |

| 11. *ක්‍රීඩාපිටිය කුලියට දීම :* | |
|---|---|
| පාසැල් සඳහා | 1,000 00 |
| ක්‍රීඩා තරඟ සඳහා දිනකට (බාහිර ආයතන හා සංවිධාන සඳහා) | 1,500 00 |
| සංගීත සංදර්ශනයක් සඳහා දිනකට | 10,000 00 |
| විදුලි ගාස්තුව | 1,000 00 |
| තැන්පත් මුදල | 5,000 00 |
| ප්‍රජාශාලාව කුලියට දීම පැය 06ක් කාලයක් සඳහා | 500 00 |
| පැය 06ක් ඉක්ම වූ විට | 750 00 |
| ළමා උද්‍යානය උපන් දින සාදයක් සඳහා | 1,000 00 |

මෙම ගාස්තුවලට අමතරව රජය විසින් අයකළ යුතු ගාස්තු ඇත්නම් එම ගාස්තු ද මේ සමඟ ගෙවිය යුතු ය.

05-95

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

**(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | පිටපතක මිළ රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2012** | | | |
| මැයි | 2012.05.04 | සිකුරාදා | 2012.04.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.11 | සිකුරාදා | 2012.04.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.18 | සිකුරාදා | 2012.05.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.25 | සිකුරාදා | 2012.05.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2012.06.01 | සිකුරාදා | 2012.05.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.08 | සිකුරාදා | 2012.05.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.15 | සිකුරාදා | 2012.06.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.22 | සිකුරාදා | 2012.06.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.29 | සිකුරාදා | 2012.06.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2012.07.06 | සිකුරාදා | 2012.06.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.07.13 | සිකුරාදා | 2012.06.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.07.20 | සිකුරාදා | 2012.07.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.07.27 | සිකුරාදා | 2012.07.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.